www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: වැටුප් අරගලය පාවාදීමේ වතු සමිති ප්‍රයත්නය ප්‍රතික්ෂේප කරනු

**Sri Lanka: Reject wage sell-out by plantation unions**

**ඩබ්ලිව්.ඒ. සුනිල් විසිනි**

**2009 සැප්තැම්බර් 15**

ශ්‍රී ලංකාවේ වතු කම්කරුවෝ, ලංකා කම්කරු කොංග්‍රසය (සීඩබ්ලිව්සී) සහ ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය (සීඑෆ්ඊ) අතර ඇති කර ගෙන ඇති වැටුප් ගිවිසුම ප්‍රතික්ෂේප කල යුතුය. අද (16) අත්සන් කිරීමට නියමිතව ඇති නව සාමූහික ගිවිසුම වනාහි තේ, රබර් හා පොල් වතුවල සේවය කරන ලක්ෂ පහක් පමන වන කම්කරුවන් තවත් වසර දෙකකට දරිද්‍රතා මට්ටමේ වැටුප්වලට ගැට ගසා තබන පාවාදීමකි.

සීඩබ්ලිව්සීය ආරම්භයේ දී රුපියල් 750ක ඒකාබද්ධ දෛනික වැටුපක් ඉල්ලා සිටි නමුත් ඉක්මනින් ම රුපියල් 500 කට පල්ලම් බැස්සේය. සෙනසුරාදා සමිතිය නිවේදනය කලේ හාම්පුතුන්ගේ සම්මේලනය සමග පැවති දුරකතන සංවාදයක දී තමන් රුපියල් 405කට එකඟ වූ බවයි. රුපියල් 290ක මූලික වැටුපක්, එයට එකතු වන රුපියල් 85ක පැමිනීමේ දීමනාවක් හා රුපියල් 30ක මිල පාරිතෝෂිකයක් ගිවිසුමට අඩංගු වේ.

එකඟ වූ වැටුප් වැඩිවීම 2007 මාර්තුවේ පසුගිය ගිවිසුමේ පටන් මේ දක්වා නිල ජීවන වියදමේ සිදු වී ඇති සියයට 55ක නැග්ම සඳහා වත් කම්කරුවන්ට සහනයක් නොසපයන බැවින්, ඇත්තටම මෙම ගිවිසුම සැලකිය යුතු වැටුප් කප්පාදුවකි. වර්තමානයේ දීමනා ඇතුලු දෛනික වැටුප යන්තම් රුපියල් 290කි.

රුපියල් 85 පැමිනීමේ දීමනාව මුලුමනින්ම ගෙවනු ඇත්තේ කම්කරුවන් මාසයකට දින 25ක් වැඩ කල හොත් පමනි. නිරතුරුවම පාහේ සමාගම් දින 25ක් වැඩ දෙන්නේ නැත. වැටුප් දැන් ශ්‍රම ඵලදායිත්වයට ගැට ගසනු ඇති බැවින් සීඑෆ්ඊ නිලධාරියකු වන ලලිත් ඔබේසේකර "ප්‍රධාන ඉදිරි පියවරක්" ලෙස ගිවිසුමට ප්‍රශංසා කලේය. තේ නිපදවන සෙසු රටවලට සන්සන්දනාත්මකව ඔවුන්ගේ "ශ්‍රම ඵලදායිත්වය පහල" බවට කම්කරුවන්ට චෝදනා කරමින්, හාම්පුතුන්ගේ සම්මේලනය ආරම්භයේ දී එකඟ වූයේ රුපියල් 30ක වැඩිවීමකට පමනි.

මාධ්‍යවලට ප්‍රකාශයක් කරමින්, සීඩබ්ලිව්සී නායක ආරුමුගම් තොන්ඩමන් ගිවිසුම "ජයග්‍රහනයක්" ලෙස වර්නනා කලේ, දිගටම තමන්ගේ ඉලක්කය වී තිබුනේ රුපියල් 360 හා 400 අතර වැටුපක් බව එලිදරව් කරමිනි. තේ කොලඹට ප්‍රවාහනය සහ වතු කලමනාකරුවන්ගේ බංගලාවල වැඩ නතර කර තිබූ සිය "සහයෝගය නොදීමේ" සීමිත විරෝධතා ව්‍යාපාරය සමිතිය විසින් වහාම අත්හිටුවන ලදි.

ආන්ඩුව දැනටමත් ගිවිසුමට සහයෝගය දී සියලු සමිති එය අනුමත කල යුතු යයි ඉල්ලා ඇත. වැවිලි කර්මාන්ත ඇමති දි.මු. ජයරත්න ඊයේ විවෘතවම මෙසේ ප්‍රකාශ කලේය: "වෘත්තීය සමිති ගනනාවක් තිබීම කම්කරු පන්තිය දුර්වල කිරීමක් නිසා ආන්ඩුවක් හැටියට අපි සන්තෝෂ වෙනවා. එහෙත් (ආර්ථික) අර්බුදය නිසා මේ රුපියල් 405 වැටුප පිලිගන්නා ලෙස අප ඔවුන්ගෙන් ඉල්ලා සිටිනවා."

ඔවුන් 2006 දෙසැම්බරයේ දී වතු කම්කරුවන්ගේ සති දෙකක වර්ජනය කඩාකප්පල් කොට වත්මන් වැටුප් ගිවිසුම පැටවීමේ දී කලාක් මෙන් වතු සමිති සියල්ලම එකම ද්‍රෝහි ක්‍රියාකලාපයක් ඉටු කරමින් සිටී. සීඩබ්ලිව්සීය කිසිදු කාර්මික ක්‍රියාමාර්ගයකට විරුද්ධ වූ අතර ගිවිසුමක් ඇති කරගනු පිනිස කම්කරුවන්ට හොරෙන් හාම්පුතුන් හා ආන්ඩුව සමග සෘජුවම එකට වැඩ කලේය.

සීඩබ්ලිව්සීය දේශපාලන පක්ෂයක් ලෙස ද ක්‍රියා කරන අතර එය පාලක සභාගයේ කොටසකි. සීඩබ්ලිව්සී නායක තොන්ඩමන්, පුද්ගලික හා රාජ්‍ය යන අංශ දෙකේ ම "වැටුප් සීමාවන්" අවධාරනය කරන ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ආන්ඩුවේ ඇමතිවරයෙකි. ගෝලීය ආර්ථික පසුබැස්ම ද මැයි මාසයේ දී බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ පරාජයත් සමග අවසන් වූ රාජපක්ෂගේ වර්ගවාදී යුද්ධයේ දැවැන්ත වියදම ද මගින් රටේ ආර්ථිකයට දැවැන්ත ලෙස පහර වැදී තිබේ.

වත්මන් වැටුප් සාකච්ඡාවන්ට සම්බන්ධ වූ අනෙක් සමිති දෙක -- ලංකා ජාතික වතු කම්කරු සංගමය (එල්ජේඊඩබ්ලිව්යු) සහ එක්සත් වතු සමිති කමිටුව (ජේපීටීයූසී) -- ඉක්මනින්ම සීඩබ්ලිව්සීය පිටුපස පෙලගැසීමට ඉඩ ඇත. එල්ජේඊඩබ්ලිව්යූ ලේකම් කේ. වේලායුදන් තමන්ට ගිවිසුම ලැබුනු බව පිලිගත් අතර එය සාකච්ඡා කරමින් සිටින බව ප්‍රකාශ කලේය. මෙම

සමිතිය අනුබද්ධ වී ඇත්තේ මහ ව්‍යාපාරිකයන්ට දක්වන සිය විවෘත සහයෝගය සම්බන්ධයෙන් මැනවින් ප්‍රසිද්ධ තත්වාරක්ෂක එක්සත් ජාතික පක්ෂයට (එජාප) යි.

තවත් සමිති තුනක් -- කඳුරට මහජන පෙරමුන (යූපීඑෆ්), ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු කොංග්‍රසය (ඩීඩබ්ලිව්සී) සහ සමස්ත ලංකා වතු කම්කරු සංගමය (ඒසීපීඩබ්ලිව්යූ) -- සීඩබ්ලිව්සීයේ ද එහි ගිවිසුමේ ද විරුද්ධවාදීන් ලෙස මවාපෙන්වීමක මේ මොහොතේ යෙදී සිටී. 2006 දී මෙන්, ඔවුන් උත්සාහ කරන්නේ, මෙම පාවාදීමට විරුද්ධව වතු කම්කරුවන් අතර පවත්නා පුලුල්ව පැතිරුනු වෛරය හා විරුද්ධත්වය පාලනය කරගැනීමටයි.

යූපීඑෆ් නායක පී. චන්ද්‍රසේකරන් ද ආන්ඩුවේ ඇමතිවරයකු වන අතර, ඔහු ද කිසිදු කාර්මික ක්‍රියාමාර්ගයකට විරුද්ධ වී ඇති අතර කම්කරුවන් වෙනුවෙන් මැදිහත් වන්නැයි ජනාධිපති රාජපක්ෂගෙන් ඉල්ලා සිටියේය. ඉරිදා හැටන් නගරයේ දී පැවති කම්කරුවන් 250ක පමන යූපීඑෆ් රැලියක දී , තම සමිතිය රුපියල් 500ක වැටුපක් සඳහා දිගටම සටන් කරන බව ඔහු ප්‍රකාශ කලේය. 2006 දී ද වර්ජනය නතර කිරීමට ආන්ඩුව සමග සහයෝගී වීමට පෙර, චන්ද්‍රසේකරන් රුපියල් 500ක වැටුපකට සටන් වදින බවට මෙම හිස් පොරොන්දුවම දුන්නේය.

ඩීඩබ්ලිව්සී නායක මනෝ ගනේෂන් ද යූපීඑෆ් සමිතියට සමාන උපාමාරුවක් දමා තිබේ. ඉරිදා බොගවන්තලාව නගරයේ පැවති කුඩා ඩීඩබ්ලිව්සී විරෝධතාවකට සීඩබ්ලිව්සීය විසින් සංවිධානය කරන ලද මැර පිරිසක් විසින් පහර දෙන ලදුව කඳුලු ගෑස් හා අනතුරු අඟවන වෙඩි ප්‍රහාර එල්ල කොට කම්කරුවන් විසුරුවා හැරීම සඳහා පොලීසියට අවශ්‍ය කඩතුරාව සම්පාදනය කෙරුනි.

2006 දී මෙන් ම, වඩාත්ම සටන්කාමී හඬ සහිත පූර්වානම් ප්‍රකාශ පැමිනී ඇත්තේ ජනතා විමුක්ති පෙරමුනට (ජවිපෙ) අනුබද්ධිත සමස්ත ලංකා වතු කම්කරු සංගමය වෙතිනි. එහි නායක රාමලිංගම් චන්ද්‍රසේකර් මෙසේ ප්‍රකාශ කලේයः "වතු ප්‍රජාවේ මෙම ඊනියා නායකයන් දිගටම සිදු කරන පාවාදීම් වතු කම්කරුවෝ ඉවසන එකක් නැහැ. කිසිදු දේශපාලන හෝ වෙනත් මතභේදයකින් තොරව ඔවුන්ගේ අයිතීන් වෙනුවෙන් සටන් වැදීමට වතු කම්කරුවන් රැලි කරන්න සමස්ත ලංකා වතු කම්කරු සංගමය සූදානම්."

මෙම ප්‍රකාශයට කිසිදු කම්කරුවෙක් රැවටිය යුතු නැත. සිය වෘත්තීය සමිති සමස්ත මහා වැඩ වර්ජනයක් කැඳවන බවට, 2006 දී ජවිපෙ සමිති නායක ලාල් කාන්ත බිරුසන් දුන්නේය. කෙසේවෙතත්, සීඩබ්ලිව්සීය සහ ආන්ඩුව හාම්පුතුන් සමග ගිවිසුමකට එලඹුනු වහාම ජවිපෙ හා සමස්ත ලංකා වතු කම්කරු සංගමය එයට යටත් වූයේ, "වර්ජනය අවසන් කරනු විනා වෙනත් විකල්පයක් නැති" බව පවසමිනි.

ජවිපෙ හා එහි සමිතිවල ඉදිරිදර්ශනය අතිශයින් ජාතිකවාදී හා වර්ගවාදී එකකි. මෙම පක්ෂය රාජපක්ෂගේ වර්ගවාදී යුද්ධයට පූර්න පිටුබලය දී එහි මිලිටරි අයවැයවලට ඡන්දය දුන්නේය. 2006 දී ආන්ඩුව වර්ජක වතු කම්කරුවන් "ත්‍රස්තවාදී එල්ටීටීඊයට" සහයෝගය දෙන්නන් ලෙස හෙලා දුටු කල, ජවිපෙ හා එහි සමිති ඉක්මනින් ම එයට අනුගත වී සිය උද්ඝෝෂනය නතර කලේය.

දැන් එල්ටීටීඊය පරාජයට පත් කෙරී ඇති තතු තුල, ආන්ඩුව "ජාතිය ගොඩනැගීම" පිනිස "ආර්ථික යුද්ධයක්" ප්‍රකාශයට පත් කර තිබේ. ව්‍යාපාරිකයන්ට ඇප දී ගලවා ගැනීමේ සිය ප්‍රයත්නයන්ට තර්ජනයක් මතු කරන කම්කරුවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී රාජපක්ෂ සහ ඔහුගේ ඇමතිවරු ඊට සමාන ක්ෂමාවිරහිත භාවයකින් ක්‍රියාකරනු ඇත. තමන්ගේ ම "ජාතිය ගොඩනැගීමේ" සැලසුම් සහිත ජවිපෙ, වැඩ කරන ජනතාව මත "ආර්ථික යුද්ධයේ" බර පටවමින්, 2006 දී එය සිදු කලාට සමාන ක්‍රියාකලාපයක් ඉටු කරනු ඇත.

වතු කම්කරුවන් අතර, ඔවුන් විකුනා දැමීමේ යෙදී සිටින සීඩබ්ලිව්සී කෙරෙහි පමනක් නොව, සියලු සමිති කෙරෙහි ඇත්තේ පුලුල්ව පැතිරුනු කෝපයක් හා සතුරු කමකි. සඳුදා දිනයේ පැවති විරෝධතාවන්ට මධ්‍යම කඳුකරයේ තේ හා රබර් වගාවේ නියුතු කම්කරුවෝ ලක්ෂ ගනනින් සහභාගී වූ අතර ඊලඟට කරන්නේ කුමක් දැයි සාකච්ඡා කලහ.

හැටන්හි වැලිඔය වතුයායේ කම්කරුවෙක් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* ප්‍රකාශ කලේ "අප මේ ගිවිසුමට එකඟ නැහැ. අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල මිල ගනන් අහස උසට නඟිද්දී රුපියල් 500 ක වැටුපක් ලැබුනත් අපේ වියදම් ගැටගසාගැනීමට බැහැ. වසර 150 ක් තිස්සේම වතු කම්කරුවන් මුහුන දී සිටින්නේ මේ ඉරනමට ම යි. අපට ස්ථිර මාසික වැටුපක් ලැබෙන්නෙ නෑ, ලැබෙන්නේ දෛනික වැටුපක් පමනයි. හැම සමිතියක්ම කමකට නැහැ. ඔවුන් අපව රවටනවා. අපේ වත්තේ කම්කරුවන් සිය ගනනක් කියා සිටින්නේ ඔවුන් සමිති වලින් ඉවත්වන බවයි."

නායබැද්ද වතුයායේ තවත් කම්කරුවෙක් සීඩබ්ලිව්සී මෙන්ම ඒ සමග පෙල ගැසෙන අනෙකුත් සමිති හෙලා දුටුවේය. "අපගේ වත්තේ කම්කරුවන් 2000 ක් පමන සිටින නමුත් ඔවුන් සමිති පහකට බෙදලා. කම්කරුවන්ට අරගලය සඳහා එක්සත් වීමේ අවශ්‍යතාව තියෙනවාः නායකයන් අප අතරමංකර තිබෙන තත්ත්වය තුල කල යුත්තේ කුමක් ද අහනවා. තොන්ඩමාන්, චන්ද්‍රසේකරන්, හා සුරේෂ් වඩිවේල්, මේ ඔක්කොම නායකයෝ ඇමතිවරු. ඔවුන් වැඩ කරන්නේ ආන්ඩු හා සමාගම් වෙනුවෙන් මිස කම්කරුවන් සඳහා නෙමෙයි."

කම්කරුවන් ගිවිසුම ප්‍රතික්ෂේප කරමින් ප්‍රමානවත් වැටුප් හා යහපත් ජීවන තත්ත්වයන් සඳහා

තමන්ගේම ස්වාධීන ව්‍යාපාරයක් දියත් කල යුතුය. ක්‍රියාකාරී කමිටු ගොඩනැගීම අවශ්‍ය වන අතර පුලුල් කාර්මික අරගලයක් දියත් කිරීමට ඉල්ලීම් මාලාවක් කෙටුම්පත් කිරීමේ  නියෝජිත සමුලුවක් කැඳවාගත යුතුය. එම ඉල්ලීම් අතරට, දෛනික වැටුප් ක්‍රමය අවසන් කිරීමත්, නිෂ්පාදනයට, පැමිනීමට හා ලාභයට ගැට නොගැසු, ප්‍රමානවත් මාසික වැටුප් ක්‍රමයක් සඳහා ඉල්ලීම් ඇතුලත් විය යුතුය.

එසේ කිරීමේ දී කම්කරුවන් තමන් නිරතව සිටින්නේ, හාම්පුතුන්ට පමනක් නොව රාජපක්ෂ ආන්ඩුවටත්, සියල්ලටමත් වඩා වෘත්තීය සමිති වලට, එරෙහි දේශපාලන අරගලයක බව වටහාගත යුතුය. 2006 වසරේ වැඩ වර්ජනය හමුවේ කම්කරුවන් මුහුනපෑ ප්‍රධාන ප්‍රශ්නය සටන්කාමීත්වය හිඟවීම නොව, දේශපාලන ක්‍රියාමාර්ගයක හා ඉදිරිදර්ශනයක අඩුවයි. ලක්ෂ සංඛ්‍යාත කම්කරුවෝ දෙසතියක් තිස්සේ අධිෂ්ඨානශීලී අරගලයක් ගෙනයනු ලැබුව ද වෘත්තීය සමිතිවල පාවාදීම හමුවේ අසරන වූහ.

හාම්පුතුන් හා ආන්ඩුව අපනයන පහත වැටීමට චෝදනා කරන්නේ කම්කරුවන්ට ය. එහෙත් කම්කරු පන්තිය ගෝලීය ආර්ථික අර්බුදයට වගකිව යුතු නැත. බංකොලොත් ලාභ පද්ධතියට වැඩ කරන ජනතාවගේ අති මූලික අවශ්‍යතා ඉටුකිරීමට නොහැකි නම්, එය අහෝසි කර දැමිය යුතුය. සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත සමාජය ප්‍රතිසංවිධානය කිරීම ට කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් සඳහා සටන් කිරීමේ දී වතු කම්කරුවන්, කම්කරු පන්තියේ අවශේෂ කොටස් හා ගම්බද දුගීන් වෙත හැරීම අවශ්‍ය කෙරේ.

දකුනු ආසියාව පුරා හා ජාත්‍යන්තරව සමාජවාදය සඳහා පුලුල් අරගලයේ දී මෙන්ම, ශ්‍රී ලංකා ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා අරගලයේ දී, සමාජවාදී සමානතා පක්ෂය විසින් ඉදිරිපත් කරනු ලබන ඉදිරිදර්ශනය මෙයයි. අප වතු කම්කරුවන්ගෙන් හා තරුනයන්ගෙන් ඉල්ලා සිටින්නේ අපගේ ඉදිරිදර්ශනය බැරෑරුම්ව හදාරමින්, සමාජවාදී සමානතා පක්ෂය කම්කරු පන්තියේ නව මහජන පක්ෂය ලෙස ගොඩනැගීම සඳහා එයට බැඳෙන ලෙස ය.

*'ශ්‍රී ලංකාවේ වතු කම්කරුවන් සඳහා සමාජවාදී ක්‍රියාමාර්ගයක්'* යන ලිපිය ද කියවන්න.

**© www.wsws.org**